ඔලිම්පික් ක්‍රීඩා සැණකෙළිය

වසර 10 යක පමණ කාලයක සිට සැළසුම් කොට වසර 7 ක පමණ කාලයක සිට, එනම් - 2005 ජූලි 6 වෙනිදා සිට සූදානම් කළ ලන්ඩන් ලන්ඩන් 2012 ඔලිම්පික් ක්‍රීඩා සැණකෙළිය ජූලි 27 වන සිකුරාදා කළඑළි බසිනු ඇත. ලොව සියලු ජාතීන් කිසිදු භේදයකින් තොරව එක්තැන් කෙරෙන සමානාත්මතාව, සහයෝගීතාව, තරඟකාරීත්වය, අභියෝගය හා චමත්කාරය කැටිකරගත් ඔලිම්පික් ලොව පැරණිතම හා ශ්‍රේෂ්ඨතම ක්‍රීඩා සැණකෙළියයි.

ක්‍රි. පූර්ව 776 දී පමණ ග්‍රීසියේ ඔලිම්පියා මිටියාවතේදී අග්‍රගණ්‍ය දෙවි කෙනෙකු වශයෙන් සැලකෙන සීයස් ෑම්–දෙවියන් පිදීම පාදක කරගත් ක්‍රීඩා තරඟාවලිය අද ඔලිම්පික් නමින් ප්‍රකටය. වරෙක පවත්වමින්ද, වරෙක නවතා දමමින්ද කිසිදු ප්‍රමිතියක් හෝ පිළිවෙලක් නුවූ මේ ක්‍රීඩා උළෙල ක්‍රමවත්ව පවත්වාගෙන යාමට 1894 දී ප්‍රංශ ජාතික බාරොන් පියරේ කර්බටින් (Baron Pierre Coubertin) ගේ පුරෝගාමීත්වයෙන් අන්තර් ජාතික ඔලිම්පික් කමිටුව (IOC) පිහිටුවන ලදී. එම කමිටුවේ මෙහෙයවීමෙන් ග්‍රීසියේ ඇතැන්ස් නුවරදී 1896 වසරේ ප්‍රථම ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වා ඇත. එදා මෙදා තුර සෑම වසර හතරකට වරක් ඔලිම්පික් ක්‍රීඩා උළෙල ලොව විවිධ නගරවල පවත්වන්නට කටයුතු සූදානම් කෙරේ. ඔලිම්පික් පවත්වන්නේ සෑම විටම අධික අවුරුද්දකදීය. එනම් දින 366ක් ඇති වසරවලදීය. 366 ලබනිවූ අධික අවුරුද්දේ ඒ වැඩිපුර දිනය දෙවියන්ගේ ආශීර්වාදය මත ලැබුණු එකක් බව විශ්වාසකරන ග්‍රීකයින් එම අධික වසරේ දෙවියන් පිදීම පිණිස මෙවැනි ක්‍රීඩාඋළෙලක් ආරම්භකර ඇති බව පෙනේ.

1916, 1940, 1944 වර්ෂවලදී පැවති ලෝක යුද්ධ නිසා ඔලිම්පික් තරඟ පවත්වා නැත.1896 වත්මන් ඔලිම්පික් උලෙලේ ප්‍රථම තරඟාවලියට රටවල් 14 කින් ක්‍රීඩකයින් 241 ක් සහභාගිවී ඇත. 2012 ලන්ඩන් තරඟය සඳහා රටවල්



අප රටට ප්‍රථම ඔලිම්පික් සම්මානය ගෙන ආ ඔලිම්පික් ශූරයා ඩන්කන් වයිට් Duncan White

2000 සිඩ්නි ඔලිම්පික් තරඟාවලියේදී ධාවනයෙන් සුසන්තිකා ජයසිංහ ලෝකඩ පදක්කමක් ලබා

ඒ තරඟයෙන් රන්පදක්කම ලැබූ මේරියනස් ජෝන්ස් සමග සුසන්තිකා ජයසිංහ. මේරියනස් ජෝන්ස් තහනම් උත්තේජක ගත් බවට පසුව ඔප්පු වූ නිසා ඇයට රන් පදක්කම අහිමි විය. ඒ නිසා සුසන්තිකාට රිදී පදක්කමක් හිමි විය.

205 කින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 12,000ක් සහභාගි වන්නාහ. තුන් වතාවක්ම ඔලිම්පික් උළෙල පැවැත්වූ නගරය ලෙස ලන්ඩනය මෙවර වාර්තා ගතවෙයි. මීට පෙර මෙහි එය පැවතියේ 1908, 1948 වසරවලදීය. 1948 ලන්ඩනයේ පැවති ඔලිම්පික් උළෙල ශ්‍රීලංකාවට හා ආසියා, අප්‍රිකානු රටවලට වැදගත්විය.

1948 දී ශ්‍රීලාංකික ඩන්කන් වයිට් (Duncan White) මීටර් 400 කඩුළු පැන දිවීමේ තරඟයෙන් දෙවන ස්ථානය ලබා අපේ රටට ප්‍රථම ඔලිම්පික් පදක්කම දිනා දුන්නේය. එමෙන්ම එහිදී ඉන්දියාව හොකී තරඟයෙන් ජයලබා ප්‍රථම රන් පදක්කමද, ජැමෙයිකාවේ ආතර් වින්ට් මීටර් 400 න් ප්‍රථම ස්ථානය හා මීටර් 800 න් දෙවන ස්ථානය ලබා පදක්කම් හිමිකර ගත්හ.

1948 ලන්ඩන් ඔලිම්පික් උළෙල තවත් විශේෂ කාර්යභාරයක් ඉටුකළේය. එනම් ආබාධිතයන් උදෙසා පැරා ඔලිම්පික් (Para Olympic) තරඟාවලිය ප්‍රථමවරට හඳුන්වා දුන්නේ ඒ 1948 ලන්ඩන් උළෙලේදීය. බ්‍රිතාන්‍යයේ විසූ ජර්මන් ජාතික වෛද්‍යවරයෙකු වූ ශ්‍රීමත් ලුඩ්විග් ගුටර්මන්(Sir Ludwig Guterman) ගේ අදහසකට අනුව ලෝක යුද්ධවලදී ආබාධිත තත්වයට පත්වූවන් සඳහා ක්‍රීඩා තරඟයක් සංවිධානය කළේය. ඔලිම්පික් තරඟයට සමාන්තරව එය පැවැත්වූ හෙයින් Pararell to Olympic යන වදන් කෙටි වී පැරා ඔලිම්පික් (Para-Olympic) යනුවෙන් ඒ තරඟාවලිය ප්‍රකටවීය. ලන්ඩන් නගරයෙන් ආරම්භ කළ මෙම පැරා ඔලිම්පික් තරඟාවලිය මෙවරද සැප්තැම්බර් 9 වන දින දක්වා ඔලිම්පික් ක්‍රීඩා සංකීර්ණයේදීම සියළු උත්සවශ්‍රීයෙන් පැවැත්වෙනවා ඇත.

ඩන්කන් වයිට් හැරුණු විට ධාවන ශූරිය සුසන්තිකා ජයසිංහ 2004 දී මීටර් 200 ධාවන තරඟයෙන් ශ්‍රීලංකාවට පදක්කමක් ලබා දුන්නාය. ශ්‍රීලංකාව ඔලිම්පික් මට්ටමේ ලද ජයග්‍රහණ අඩු වුවද සහභාගිත්වය

LONDON 2012

ශ්‍රීලංකාවේ ප්‍රධාන දේශපාලනඥයින් දෙදෙනෙකුගේ දරුවන්ද කිසිදු දේශපාලන බලපෑමකින් තොරව හුදෙක් දක්ෂතා මත ඔලිම්පික් තරඟවලට සහභාගිවී ඇත. ඒ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනගේ පුත් රවී ජයවර්ධන වෙඩිතැබීමේ තරඟයටද, ඒ රජයේ ජ්‍යෙෂ්ඨ ඇමති වරයෙකුව සිටි යූ. බී. විජේකෝන්ගේ පුත් නිරෝෂන් විජේකෝන් බැඩ්මින්ටන් තරඟයටද සහභාගි වී තිබේ.

1896 ප්‍රථම ඔලිම්පික් තරඟයට කාන්තාවන්ට සහභාගිවීමට අවසර නොතිබූ අතර 2012 ලන්ඩන් තරඟයේදී මෙතෙක් නොපැවැත්වූ කාන්තා බොක්සිං තරඟය ද ඇතුළත්කර තිබේ.

ක්‍රීඩාව මානසික මෙන්ම ශාරීරික ව්‍යායාමයකි. එය ජය පරාජය විඳ දරාගැනීමේ ශක්තිය ප්‍රගුණ කරයි. බ්‍රිතාන්‍ය මහ රාජිණගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වන ලන්ඩන් 2012 ඔලිම්පික් ක්‍රීඩා උළෙල මානව සංහතියේ තවත් වාර්තා බිහිකරනවා ඇත. 2012 ලන්ඩන් නුවරට පසුව 2016 ඔලිම්පික් තරඟාවලිය පැවැත්වෙනු ඇත්තේ බ්‍රෙසීලයේ රියෝද ජැනෙයිරෝ නගරයේය.

ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරි

♦ **මේජර් වී. බී. කරුණාරත්න**

Major V. B. Karunaratne Oxford UK

No one can bathe twice in the same river !

එකම ගඟේ දෙවරක් නාන්නට බැරිය!



1. We make them cry who care for us. We cry for those who never care for us. And we care for those who will never cry for us.

This is the truth of life, it's strange but true.
Once you realise this, it's never too late to change.

2. Don't make some one priority in your life, when you are an option in their life.
Relationships work best when they are balanced.

3. Never try to explain yourself to any one.
Because the person who likes you doesn't need it, and the person who dislikes you won't believe it.

4. When you keep saying you are busy, then you are never free. When you keep saying you have no time, then you will never have time. When you keep saying that you will do it tomorrow, then your tomorrow will never come.

5. When we wake up in the morning, we have two choices. Go back to sleep and dream, or wake up and chase those dreams. Choice is yours.

6. Don't make promises when you are in joy. Don't reply when you are sad. Don't take decisions when you are angry.
Think twice and act wise.

7. Time is like a river. You cannot touch the same water twice, because the flow that has passed will never pass again. Thus one cannot bathe in the same river twice. What is precious is the present time in which we live now. Therefore enjoy every moment of life.

♦ ***දිපා සඳමාලි හේරත්***

Deepa Sandamali Herath USA

අප ගැන තැකීමක් කරන, අපට සමීප අය අපි හඬවන්නෙමු. අප ගැන බිඳක්වත් නොතකන අය ගැන අපි කඳුළු සලන්නෙමු. අප ගැන කිසි දිනක කඳුලක් නොසලන අයට අපි වඩාත් සලකන්නෙමු. ආදරය කරන්නෙමු.
මෙය පුදුමයකි. එහෙත් ඇත්තය. මෙය වටහා ගත් විට ඒ ස්වභාවය වෙනස්කර ගන්නට ඔබට හැකිය.

කිසිවෙකුට ඔබේ ජීවිතයේ විශේෂ තැනක් නොදෙනන්න ඔබට ඔවුන්ගේ ජීවිතයේ නිකම් සාමාන්‍ය කෙනෙක් පමණ නම්. සබඳතාවන් දෙපැත්තටම සමානව සමබරව තිබිය යුතුය.

ඔබ කවුදැයි කිසිවෙකුට විස්තර කරන්නට නොයන්න. ඔබට හිතවත් කෙනාට ඒ විස්තර වැඩක් නැත. ඔබ ගැන ඒ අය හොඳින් දන්නා නිසාය. ඔබට අකමැති කෙනෙකුට එසේ විස්තර කළොත් කොහොමත් ඔවුන් එය විස්වාස කරන්නේ නැත.

ඔබට වැඩ අධිකයයි නිතර කීවහොත් කොහොමත් වැඩ අධික වෙයි. වෙලාවක් නැතැයි කිවහොත් වෙලාවක් ඇත්තේම නැත. හෙට කරන්නම් යයි කිවහොත් ඒ හෙට ඔබ වෙත කිසිදාක නො එයි.

උදේ අප නින්දෙන් පිබිදුන විට අපට කරන්නට ඇත්තේ කාර්යයන් දෙකකි. එකක් නම් එක්කෝ ආපහු නින්දට ගොස් සිහින දකින්නටය. නැත්නම් නැගිට ඒ සිහින පසුපස හඹාගොස් ඒවා සැබෑකරගන්නටය. තීරණය අප සතුය.

ඔබ ප්‍රීතියෙන් ඔදවැඩී ගොස් සිටින අවස්ථාවක කාටවත් පොරොන්දු දෙන්නට එපා !
ඔබ දුකෙන් සිටින අවස්ථාවක කිසිව කට පිළිතුරු ලියන්න යන්න එපා !
තරහ ගොස් සිටින අවස්ථාවක කිසිදු තීරණයක් ගන්න එපා!

කාලය යනු ගංගාවකි. එය ගලා යයි. හැම මොහොතකම වෙනස් වෙයි. ඒ නිසා එකම ගඟට වුවද දෙවරක් බැස නාන්නට බැරිය. දෙවන වරට ඔබ ඒ ගඟටම නාන්නට බැස්සොත් ඒ මොහොතේ වෙන වතුරකි. කලින් වතුර නොවේ. වෙනස්වීම හැම ක්ෂණයක් පාසා සිදුවෙයි. නවත්වන්නට බැරිය. වඩා වැදගත් වන්නේ මේ අප ජීවත්වන මොහොතය. ගියොත් යළි නොඑයි.
ඒ නිසා දැන්, මේ දැන්, මේ වර්තමාන මොහොතේ සතුටෙන් ජීවත් වන්න!